**ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2018 ඔක්තෝබර් 16 දින නිකුත් කරන ලදි. ගිණුම් සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වනු ලබන අතර එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණාත්මක බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන් දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 128 ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- | --- | --- |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු | 2.1.1 |
| | | 2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.1.2(අ) |
| | | 3. අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම. | 2.1.2 (ආ) |
| | | 4. තොරතුරු කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීමේ ප්‍රමාදය | 2.1.2(ඇ) |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 |
| | | 2. පොදු තැන්පත් ගිණුම | 2.7 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 3. වත්කම් ලේඛනගත කිරීමේ අඩුපාඩු<br>4. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්<br>5. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරිම | 2.2 (අ)<br>2.2(ආ)<br>2.2 (ඇ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි.<br>2. වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරිම. | 2.1.1<br>2.1.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.6(ආ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම<br>2. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.<br>3. තොරතුරු කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීමේ ප්‍රමාදය<br>4. අවිධිමත් ගනුදෙනු<br>5. කළමනාකරණ දුර්වලතා | 2.1.2(අ)<br>2.1.2(ආ)<br>2.1.2 (ඇ)<br>2.3<br>2.4 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලැසුම් කිරීම

දෙපාර්තමේන්තුව විසින් ඉටු කල යුතු ප්‍රධාන කාර්යභාරයන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ සකස් කර තිබූ ක්‍රියාකාරී සැලසුමේ ආරම්භ කිරීමට යෝජිත වගා හා ඉකුත් වසරවල ආරම්භ කළ වගා සඳහා ගෙවිය යුතු සහනාධාර වෙන වෙනම හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කිරීම් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් /ප්‍රතිඵල (Output / Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ප්‍රධාන කාර්යයන් දෙකක් ඉටු කිරීම වෙනුවෙන් විවිධ වැඩසටහන් 10 ක් හඳුනාගෙන ඒ සඳහා රු. මිලියන 900 ක ප්‍රතිපාදන සලසා තිබුණද අපේක්ෂිත නිමැවුම් මට්ටම (output) අත්පත් කර ගෙන නොතිබුණු පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(I) සමාලෝචිත වර්ෂයේ කුඩා රබර් වතුහිමියන් ගේ හා වැවිලි සමාගම්වල පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර් 2,700 ක හා හෙක්ටයාර් 1,500 ක රබර් නැවත වගා කිරීමට අපේක්ෂා කර තිබුණද ඉන් නැවත වගාකර තිබුනේ පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර් 787 ක හා හෙක්ටයාර් 59.52 ක පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලසුම් කල ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 70 ක් හා සියයට 96 ක් වී තිබුණි.

(II) සමාලෝචිත වර්ෂයේ සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල නව ඉඩම් හෙක්ටයාර් 2,760 ක රබර් ද හෙක්ටයාර 460 ක අතුරු බෝග ද වගා කිරීමට සැලසුම් කර ඇතත් වගාකර තිබුනේ පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර් 327.8 ක හා හෙක්ටයාර් 240.71 ක පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලසුම් කල ප්‍රමාණයෙන් සියයට 88 ක් හා සියයට 47 ක් වී තිබුණි.

(III) සමාලෝචිත වර්ෂයේ කුඩා වතු හිමියන් හා වතු සමාගම්වල ඉඩම් හෙක්ටයාර් 3,750 ක වැසි ආවරණ යෙදීම වෙනුවෙන් සහනාධාර ගෙවීමට සැලසුම් කළද වැසි ආවරණ යොදා තිබුණේ ඉඩම් හෙක්ටයාර් 1,235.41 ක පමණි. ඒ අනුව වැසි ආවරණ නොයෙදූ ප්‍රමාණය සැලසුම් කල ප්‍රමාණයෙන් සියයට 67 ක් වී තිබුණු අතර දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් වැසි ආවරණ යෙදීම දිරිගැන්වීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(IV) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රබර් පැළ 1,650,000 ක් නිෂ්පාදනය කර බෙදාහැරීමට සැලසුම් කර ඇතත් , 2017 දෙසැම්බර් 31 දිනට රබර් පැල 1,045,956 ක් නිෂ්පාදනය කර ඉන් පැල 664,651 ක් එනම් ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 40 ක් බෙදාහැර තිබුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පිරිවැය රු. 185,842,375 ක් වැය කර පැල තවාන් 8 ක් පවත්වා ගෙන ගියද සමාලෝචිත වර්ෂයේ පැල විකුණුම් ආදායම රු. 56,637,720 ක් වී තිබුණි. ඒ අනුව රබර් පැළයක නිෂ්පාදන පිරිවැය පාලනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) තොරතුරු කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීමේ ප්‍රමාදය**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, පුද්ගලික සමාගමක් සමඟ 2016 මාර්තු 02 දින තොරතුරු කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 25.43 කට ගිවිසුම් ගත වී තිබුණි. එම ගිවිසුම ප්‍රකාරව අදාළ කාර්යය 2016 දෙසැම්බර් මස අවසන් විය යුතු වුවත් 2018 අගෝස්තු මස වන විටත් ගිවිසුම්ගත මුදලින් රු.මිලියන 13.99 ක් ගෙවා තිබුණ ද පද්ධතියේ කටයුතු අවසන් කර නොතිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වත්කම් පිළිබඳ තොරතුරු 2017 නොවැම්බර් 30 දින වන විට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යැවිය යුතුව තිබුණත් එම තොරතුරුවලින් වාහන පිළිබඳ විස්තර පමණක් යවා තිබුණු අතර අනෙකුත් ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු 2018 අගෝස්තු 30 දින වන විටත් යවා නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිල නිවාස 11 ක් නිසි කලට අළුත්වැඩියා හා නඩත්තු කිරීම සිදුනොකිරීම නිසා එම ගොඩනැගිලි දිරා යමින් පැවතුනි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වෙනත් ආයතන සතු නිල නිවාස 24 ක් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සෙස් බදු අය කිරීම**

2006 අංක 20 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල් පනතේ 7 වන වගන්තිය යටතේ සෙස් බදු සඳහා වූ නියෝගවල 2(1)(ඇ) හා 2(3)(ඉ) ඡේද අනුව, අපනයන කිරීම සඳහා හෝ දේශීය පරිභෝජනය පිණිස නිෂ්පාදනය කරනු ලබන ස්වභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු රබර් කිලෝ ග්‍රෑම් එකකට රු.4 ක සෙස් බද්දක් එම අමු රබර් මිලදී ගන්නා අවස්ථාවේ දී සැපයුම්කරුවන්ගෙන් අයකර කර්මාන්තකරුවන් විසින් දෙපාර්තමේන්තුවට ගෙවනු ලැබිය යුතු වේ. එසේ වුවත් පරීක්ෂාවට ලක් වූ රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරනු ලබන කර්මාන්තකරුවකු ඉහත නියෝග අනුව සැපයුම්කරුවන්ගෙන් රබර් මිලදීගන්නා අවස්ථාවේ අය කළ සෙස් බදු දෙපාර්තමේන්තුවට ගෙවීමේදී සෙස් බදු මුදලින්, එම කර්මාන්තකරු අපනයනයේ දී කිලෝ ග්‍රෑම් එකකට රු.4 බැගින් රේගුවට ගෙවූ සෙස් බදු මුදල අඩුකර ගෙවා තිබුණි. ඒ අනුව 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එසේ අඩු කර ගත් සෙස් බදු මුදල රු.195,796,741 ක් වී තිබුණි.

**(ආ) ගොඩනැගිලි කුලියට ගැනීම**

දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය පවත්වා ගැනීමට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට අමාත්‍යාංශ අනුමැතිය 2016 ජනවාරි 28 දින ලැබුණ ද මාස 08 කට පසු එනම් 2016 ඔක්තෝබර් 08 දින අදාළ පුවත්පත් දැන්වීම් පළ කර තිබුණි. ඒ අනුව ලංසු කැඳවීමේ දී එක් ලංසුවක් පමණක් ලැබී තිබූ අතර තරඟකාරි මිලක් ලබා ගැනීම සඳහා නැවත මිල කැඳවීම් කර නොතිබුණි. තවද, වාර්ෂික කුළිය රු. 31,774,152 ක් වූ මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 835 (2) (ඇ) පරිදි ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබා ගෙන නොතිබුණි.

## 2.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා බත්තරමුල්ල ප්‍රදේශයෙන් 2009 පෙබරවාරි 27 දින රු.මිලියන 59.3 ක් ගෙවා මිල දී ගත් පර්චස් 75 ක ඉඩමක් නිෂ්ක්‍රියව තිබියදී එහි දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය ඉදි නොකර වර්ග අඩි 13,157 ක ගොඩනැගිල්ලක් එම ප්‍රදේශයෙන්ම රු. 2,647,847ක මාසික කුළියක් යටතේ වසර 03 කට රුපියල් 95,322,492 කට බදු ගෙන තිබුණි .

(ආ) ඉකුත් වර්ෂයේ නොවැම්බර් මස රබර් ක්ෂේත්‍රයේ විදේශ පුහුණුවක් සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව සහභාගී වූ රබර් ක්ෂේත්‍රයට අයත් නොවන නිලධාරියෙකු වෙනුවෙන් දෙපාර්තමේන්තුව රු.493,883 ක් වැය කර තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ වටිනාකම රු.3,503,026 ක් වූ පොලිතීන් බෑග් 910,000 ක් සැපයීමට අදාල ප්‍රසම්පාදනයේ දී, පිරිවිතර අනුව පොලිතීන් බෑග්වල ප්‍රතිචක්‍රීය කරනලද පොලිතීන් අඩංගු නොවියයුතු වුවත් මිලදීගත් පොලිතීන් බෑග්වල ගුණාත්මකභාවය සම්බන්ධව රබර් පර්යේෂණ ආයතනය විසින් තහවුරු කළ වාර්තා අනුව ප්‍රතිචක්‍රීය කරන ලද පොලිතීන් අඩංගු බව වාර්තාකර තිබියදීත් ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

## 2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සකසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 753.85 | 741.05 | 12.79 | 1.69 |
| | මූලධන | 96.00 | 60.05 | 35.95 | 37.44 |
| | **එකතුව** | **849.85** | **801.10** | **48.74** | **5.73** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 229.30 | 219.54 | 9.75 | 4.25 |
| | මුලධන | 869.50 | 852.12 | 17.38 | 1.99 |
| | **එකතුව** | **1,098.80** | **1,071.66** | **27.13** | **2.46** |
| 2015 | පුනරාවර්තන | 2,589.35 | 2,302.45 | 286.89 | 11.07 |
| | මුලධන | 1,102.00 | 892.10 | 209.89 | 19.04 |
| | **එකතුව** | **3,691.35** | **3,194.56** | **496.78** | **13.45** |
| 2016 | පුනරාවර්තන | 315.29 | 298.86 | 16.43 | 5.21 |
| | මුලධන | 1,069.50 | 775.68 | 293.82 | 27.47 |
| | **එකතුව** | **1,384.79** | **1,074.54** | **310.25** | **22.40** |
| 2017 | පුනරාවර්තන | 325.09 | 317.85 | 7.24 | 2.22 |
| | මුලධන | 1,018.00 | 785.82 | 232.18 | 22.80 |
| | **එකතුව** | **1,343.09** | **1,103.67** | **239.42** | **17.82** |

සමාලෝචිත වර්ෂයේදී මුලධන වැය විෂයයන් 4 ක් සඳහා එකතුව රු. මිලියන 990.50 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 762.18 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක සිට සියයට 49.72 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 19.00 | 18.64 | 14.50 | 16.80 | 55.00 | 37.55 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.39,484,296 ක් හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු. 37,550,148 ක් වීම නිසා දෙපාර්තමේන්තු පොත් ශේෂය භාණ්ඩාගාර පොත් ශේෂයට වඩා රු.1,934,148 ක් වැඩියෙන් තිබුණි. එම වෙනස සමාලෝචිත වර්ෂයේදී ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව රු.145,452 ක් වු හිඟහිටි ණය ශේෂ වර්ෂ 5 ට වැඩි කාලයක සිට පැවත එමින් තිබු අතර පසුවිපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

**2.7 පොදු තැන්පත්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 11.45 ක් වූ අතර එම ශේෂවලට අදාළ කේවල ශේෂ හා කාල විශ්ලේෂණ වාර්තා පිළියෙල කර නොතිබුණි.

**2.8 මානව සම්පත් කළමනාකරණය**

**2.8.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වෙන අතර සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය සඳහා රු. මිලියන 229.91 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 23 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 04 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 384 | 283 | 101 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 77 | 66 | 11 |
| | එකතුව | 508 | 376 | 132 |